සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය - 2021
Diaganostic Test

පැය දෙකයි
Two hours

බුද්ධ ධර්මය I,II
Buddhism I.II

7 ශ්‍රේණිය
Grade 7

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ගිහියාගේ නිත්‍ය ශීලය මෙන්ම ගෘහස්ථ ශීලය ලෙසද හඳුන්වනු ලබන්නේ,
I. ආජීවක අෂ්ටමක ශීලය යි. II අෂ්ටාංග ශීලය යි. III පංච ශීලය යි.

(2) " බුදුරජාණන් වහන්සේ රහසින් වත් පව් නොකළ හෙයින් ද, සියලු කෙලෙස් නැසූ හෙයින් ද, සියලු පූජාවන් ලැබීමට සුදුසු හෙයින් ද ",

I. අරහං නම් වන සේක
II. සම්මා සම්බුද්ධ නම් වන සේක
III. ලෝකවිදූ නම් වන සේක

(3) බුදුරජාණන් වහන්සේ තුළ පැවති ඉවසීමේ ගුණය ප්‍රකට වන අවස්ථාවක් නොවන්නේ,

I. චිංචි මාණවිකාවගේ සිද්ධියයි .
II. සුන්දර පරිබ්‍රාජිකාවගේ සිද්ධියයි.
III. කළාබු නම් රජුගේ සිද්ධියයි .

(4) දස පුණ්‍යක්‍රියාවන් හි වෘද්ධාපචායනය ලෙස හඳුන්වන්නේ,

I. අසරණයින්ට පිහිට වීමයි.
II. වැඩිහිටියන්ට සැලකීමයි.
III. අන්‍යයන්ට උපකාර කිරීමයි

(5) "ඒ ශ්‍රමණ භවත් ගෞතමයෝ තමන් හමුවට එන අය ප්‍රිය වචනයෙන් පිළිගත්තෝ ය" යන ප්‍රකාශයෙන් බුදු රජාණන් වහන්සේ අගය කිරීමට ලක් කළේ,

I. සෝණදණ්ඩ බමුණා විසිනි.
II. පුණ්ණ තෙරුන් වහන්සේ විසිනි.
IV. ගෝදත්ත තෙරුන් වහන්සේ විසිනි.

- ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් දී තිබෙන ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ තිබෙන වරහන තුළ යොදන්න.

(6) පැරණි ගොවියෝ වී අස්වැන්නේ මුල් කොටස පමණක් නොව සෙසු භව බෝගවල මුල් කොටසද විහාරස්ථානයට පූජා කිරීම සිරිතක් කොට ගත්හ. ( )

(7) සිගාලෝවාද සූත්‍රය ට අනුව අවශ්‍ය කටයුතු සිදු කර දීම ගුරුවරුන්ගෙන් ශිෂ්‍යයන්ට ඉටු විය යුතු යුතුකමකි . ( )

(8) පන්ති කාමරයට පැමිණෙන ගුරුතුමා දුටු විට අසුනෙන් නැගිට ආචාර කිරීම, යහපත් සිසුන්ගේ ලක්ෂණයකි . ( )

(9) අනුවණකමින් තීන්දු තීරණ ගත් සාත්තු නායකයකුගේ චරිත ලක්ෂණ ක්ෂාන්තිවාදී ජාතකයෙන් විස්තර වේ. ( )

(10) බෞද්ධ දරුවන් වන අප වෛරයෙන් අවෛරයට ගමන් කළ යුතුය. ( )

- ප්‍රශ්න අංක 10 සිට 15 තෙක් දී තිබෙන ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

**(විශාඛා ,තපස්සු භල්ලුක, ජීවිත, වෙසක් ,පුණ්ණ)**

(11) පළමු ශික්ෂාපදය ආරක්ෂා කරන්නා සියලු දෙනාගේ …………………… අයිතිය සුරක්ෂිත කරයි.

(12) …………………… හිමියන් තුළ පැවති ඉවසීමේ ගුණය උන්වහන්සේ සුනාපරන්ත නම් ජනපදයට වැඩම වීමට සුදානම් වූ අවස්ථාවේ බුදුරදුන් විමසූ ප්‍රශ්නවලට දුන් පිළිතුරු වලින් හෙළිවේ.

(13) බුද්ධත්වයෙන් පසු බුදුරජාණන් වහනසේ මුල්වරට කිඹුල්වත්පුරයට වැඩම කළේ …………………… පුරපසළොස්වක පොහෝ දිනදී ය.

(14) බිරිඳක, ලේලියක, මවක ලෙසින් සිය යුතුකම් හා වගකීම් නිසි පරිදි ඉටු කිරීම …………………… උපාසිකාවගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශයකි.

(15) බුදුන් හා දහම් සරණ ගිය පළමු උපාසකවරුන් ලෙස හැඳින්වෙන්නේ …………… …………… ය.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී තිබෙන ප්‍රශ්න A තීරුවේ දැක්වෙන ප්‍රශ්නයට අදාළ පිළිතුර B තීරුවෙන් තෝරා පිළිතුරට අදාළ අක්ෂරය සමඟ ගලපා යා කරන්න.**

| A | B |
|---|---|
| (16) බෝසතාණන් බුද්ධත්වයට පත්වූයේ, | a) විශාඛා සිටු දියණිය |
| (17) සිදුහත් බෝසතාණෝ දුෂ්කර ක්‍රියා කල වසර ගණන | b) හයකි |
| (18) සිදුහත් කුමරු ගිහිගෙය හැර ගියේ, | c) පහකි |
| (19) "මිගාර මාතා" නමින් ප්‍රසිද්ධ වූයේ, | d) ඡන්න ඇමති |
| (20) ඉවසීමේ ආනිශංස ධර්ම ගණන | d) වෙසක් පෝය දා |

(ලකුණු 2X20 = 40)

11 කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

(1) කෙටි පිළිතුරු සපයන්න

1. බුදුරජාණන් වහන්සේ පස්වග තවුසන්ට දේශනා කළ සූත්‍රය කුමක්ද?
2. බුදුරජාණන් වහන්සේ ගෙන් පිහිට ලැබූ අසරණයින් දෙදෙනෙකු නම් කරන්න.
3 නව අරහාදී බුදුගුණවලින් දෙකක් නම් කරන්න.
4 "ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ - වැඩිකොට ඇඳුමුත් ඇඟ නොමගන්නේ" යන පද්‍ය සම්පූර්ණ කරන්න.
5 කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් වන මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ලක්ෂණ දෙකක් නම් කරන්න.
6 බුදු සසුනේ අග්‍රදායකයා සහ අග්‍රදායිකාව කවුරුන්ද?
7 සිරිත් හා විරිත් යන්නෙහි අරුත දක්වන්න.
8 ගුරුසිත නොරිදවා.... යන කවිය ඇතුළත් ග්‍රන්ථය කුමක්ද?
9 දස පාරමිතා ධර්ම අතර සයවෙනි පාරමිතාව ලෙස දැක්වෙන පාරමිතාව නම් කරන්න.
10 අපණ්ණක ජාතක කතා පුවතින් චරිතායනය කරගත හැකි නායකත්ව ගුණාංග දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 2X10 = 20)

2 i බුදුරජාණන් වහන්සේ යුතුකම් හා අයිතිවාසිකම් දක්වමින් දේශනා කරන ලද සූත්‍රය කුමක්ද? ලකුණු 2
ii ගුරුවරුන් විසින් සිසුන්ට ඉටුකරනු ලබන යුතුකම් දෙකක් නම් කරන්න. ලකුණු 3
iii පාසල් ශිෂ්‍යයින් වන ඔබට මනා ගුරු සිසු සබඳතාවක් ගොඩනගා ගැනීමෙන් ඇතිවන ප්‍රයෝජන පහක් ලියන්න. ලකුණු 5

3 i විරතිය හා සමාදානය වෙන වෙනම පැහැදිලි කරන්න. ලකුණු 2
ii පුද්ගලයන් පන්සිල් සුරැකීමේ දී විරතියට අනුව අවධානය යොමු කල යුතු අංශ තුනක් ලියන්න. ලකුණු 3
iii පංච ශීලය ආරක්ෂා කිරීම නිසා සමාජයට සිදුවන යහපත පැහැදිලි කරන්න. ලකුණු 5

4 i සහජීවනය යනු කුමක්ද? ලකුණු 2
ii සතර බ්‍රහ්ම විහරණ වලින් තුනක් නම් කරන්න. ලකුණු 3
iii ශ්‍රී ලාංකීක සමාජය සහජීවනයෙන් යුතුව ක්‍රියා කරන සමාජයක් බව පෙන්වා දෙන්න. ලකුණු 5

5 i "අග්‍රශෂ්‍ය දානය " යනු කුමක්ද? ලකුණු 2
ii බෞද්ධයන්ගේ උපතේ සිට මරණය දක්වා සිදුවන විශේෂ සිදුවීම් තුනක් ලියන්න. ලකුණු 3
iii "බෞද්ධයන් ආගන්තුක සත්කාරය මැනවින් සිදු කරයි " මෙම කියමන කෙටියෙන් පැහැදිලි කරන්න. ලකුණු 5

6 i බෞද්ධයාගේ අත්පොත ලෙස සලකනු ලබන ධම්ම පද ග්‍රන්ථය අයත් නිකාය හා පිටකය නම් කරන්න. ලකුණු 2

ii 'අසවලා මට බැන්නේය, පහර දුන්නේය, මා සතු දෙය පැහැර ගත්තේය, යනුවෙන් නැවත නැවත සිතන තැනැත්තාගේ වෛරය නොසන්සිඳෙන' බව පෙන්වා දෙමින් දේශනා කරන ලද ගාථාව ලියා දක්වන්න. ලකුණු 3

iii අනුසෝතගාමී හා පටිසෝතගාමී යන්න පැහැදිලි කරන්න. ලකුණු 5

- පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න

7 i බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය ලකුණු 5

ii අනේපිඬු සිටුතුමා ලකුණු 5

iii පන්සිල් ලකුණු 5

iv වැඩිහිටියන්ට සැලකීම ලකුණු 5

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය - 2021 | 6 ශ්‍රේණිය
Diaganostic Test | Grade 6

බුද්ධ ධර්මය I,II | පිළිතුරු පත්‍රය
Buddhism I,II | Answer praper

## 1 - පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | iii | 6 | √ | 11 | ජීවිත | 16 | e) |
| 2 | i | 7 | X | 12 | පුණ්ණ | 17 | b) |
| 3 | iii | 8 | √ | 13 | වෙසක් | 18 | d) |
| 4 | ii | 9 | X | 14 | විශාඛා | 19 | a) |
| 5 | i | 10 | √ | 15 | තපස්සු භල්ලුක | 20 | c) |

## ii කොටස.

01- i දම්සක් පැවතුම් සූත්‍රය ධම්මචක්කපවත්තන සූත්‍රය

ii සුනීත / සෝපාක / අසරණ මහලු පියෙක් / වරදට හසුවූ නිවැරදි ගොවියෙක් / පටාචාරා

iii අරහං , සම්මා සම්බුද්ධ, විජ්ජාචරණ සම්පන්න, සුගත, ලෝකවිදූ, අනුත්තරෝ පුරිසදම්ම සාරථී,සත්ථා දේවමනුස්සානං,බුද්ධ, භගවා

iv ඇඳුමට වැඩිවියදම් නොකරන්නේ
වැඩිකොට ඇඳුමුත් ඇඳ නොමගන්නේ
ගමනට ගෙදරට එක නාඳින්නේ
වයසට පමණට ඇඳුම් අඳින්නේ

v 05 වන පාඩමේ 35 පිටුව ඇසුරින් ලකුණු දෙන්න

vi අග්‍රදායකයා -අනේ පිඩු සිටුතුමා අනාථ පිණ්ඩික සිටුතුමා
අග්‍රදායිකාව - විශාඛා සිටු දේවිය

vii සිරිත් - අප විසින් පුරුදු කළයුතු හොඳ දේවල්ය.
මේවා චාරිත්‍ර ලෙසද හඳුන්වයි.
විරිත් - අප විසින් නො කළයුතු නරක දේවල්ය. වාරිත්‍ර නම් වේ .

viii කාව්‍යශේඛරය.

ix ඛන්ති පාරමිතාව /ක්ෂාන්ති පාරමිතාව

x 11 පාඩමේ 83 පිටුව බලන්න

ලකුණු 2x 10 = 20

2-i සිගාලෝවාද සූත්‍රය ලකුණු - 2

ii මැනවින් හික්මවීම ලකුණු - 3
මැනවින ඉගැන්වීම
සියලු ශිල්ප ඉගැන්වීම
යහළු මිත්‍රාදීන්ට හඳුන්වාදීම
අපට රැකවරණය සැලසීම (10 පාඩම 73 පිටුව බලන්න)

iii සිසුවා ලියා ඇති කරුණුවලට අදාළව ලකුණු ලබා දෙන්න ලකුණු - 5

3-i විරතිය යනු වරදින් වෙන්වීමයි. අකුසලයෙන් වෙන්වීමයි. ලකුණු - 2
සමාදානය යනු යහපත් දේ කිරීමයි. කුසලයෙහි නිරතවීමයි.
08 පාඩම- 59 පිටුව බලන්න.

ii තමා වරදින් මිදීම ලකුණු - 3
අන් අය ලවා වැරදි නොකරවීම
වරද අනුමත නොකිරීම හා ඊට අනුබල නොදීම

iii සියලූ සතුන්ගේ ජීවිත සුරක්ෂිතතාව ඇතිවේ. ලකුණු - 5
පවුල් සංස්ථාව සුරක්ෂිත වේ. නිරෝගී සමාජයක් බිහිවේ.
සිසුවා ලියා ඇති පිලිතුරට අදාලව ලකුණු ලබාදෙන්න.

4-i ආගම් ජාති කුල භේද නොසලකා සමගියෙන් හා සහයෝගයෙන් ජීවත් වීමයි. ලකුණු - 2

ii මෙත්තා, කරුණා, මුදිතා ,උපේක්ඛා ලකුණු - 3

iii සිසුවා ලියා ඇති පිළිතුරට අදාළව ලකුණු ලබාදෙන්න ලකුණු - 5

5-i කුඹුරු වලින් අස්වනු ලබාගැනීමෙන් අනතුරුව එහි පළමු කොටස ත්‍රිවිධ රත්නය ලකුණු - 2
උදෙසා පූජා කිරීමයි.

ii 13 වන පාඩමේ 101 පිටුව බලන්න ලකුණු - 3

iii සිසුවා ලියා ඇති පිලිතුරට අදාලව ලකුණු ලබාදෙන්න. ලකුණු - 5
(13 වන පාඩමේ 98 පිටුව බලන්න.)

6 සූත්‍ර පිටකය / ඛුද්ධක නිකාය

i

ii අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මේ ලකුණු - 3
යේ තං උපනයිහන්ති - වේරං තේසං න සම්මති.

iii 7 වන පාඩමේ 56 පිටුව බලන්න ලකුණු - 5
(අනුසෝතගාමී යනු ගඟ පහළට ම යාම හෙවත් යටි ගං බලා යන දහමකි. එනම්
වෛරයෙන් වෛරයට යන ක්‍රෝධයෙන් ක්‍රෝධයට යන මිනිස් සමාජයකි.)
පටිසෝතගාමී යනු උඩු ගං බලා යාමට මග පෙන්වීමයි. එනම් අප යා යුත්තේ
වෛරයෙන් අවෛරයට, ක්‍රෝධයෙන් ආක්‍රෝධයටයි. බුදු දහම පටිසෝතගාමී දහමකි.

| | | | |
|---|---|---|---|
| 7-i | බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය- 02 පාඩම | | ලකුණු 05 |
| ii | අනේපිඬු සිටුතුමා | - 06 පාඩම | ලකුණු 05 |
| iii | පන්සිල් | - 08 පාඩම | ලකුණු 05 |
| iv | වැඩිහිටියන්ට සැලකීම | - 13 පාඩම | ලකුණු 05 |